


# මිතුරු පසමිතුරු

**අද** ලෝකය පුරාම තැනින් තැන සිදුවන යුද්ධයයි, ත්‍රස්තවාදියයි නිසා ගලා යන කඳුළු, ලේ ගංගාව දැක්කම හිතෙන්නේ ලෝක විනාශය අත ළඟයි කියලා. හැබැයි බොහෝ දෙනෙකුට අද ඒක සාමාන්‍ය දෙයක්. මිනිස්සු ගල්වෙලා වගේ රූපවාහිනී දිහා බලාගෙන ඉන්නවා. බලන් ඉඳලා දිග සුසුමක් පිටකරලා නින්දට යනවා. ඒ දෛනික ජීවිතේට කොටසක් වෙලා හමාරයි.

නැවතත් ඊශ්‍රාලය - ලෙබනනයට බෝම්බ දාන්න පටන් අරගෙන. වැටෙන බෝම්බ දැක්කමමට මතක් වුණේ එහෙ වැඩ කරන අපේ අසරණ ලාංකිකයන්. සේවකයන් ලක්‍ෂයක් පමණ එහෙ වැඩ කරනවා. බොහෝ දෙනෙක් ගෘහ සේවිකාවෝ. මෙකෙන් පස්සේ ඒ පවුල්වල අයත් ලංකාව යුද්දෙත් එක්ක යුද්ද දෙකකට අහුවෙලා. එදා ඉරාක කුවේට්වලට ගහන කොටත් සිද්ද වුනෙ මේ දේමයි. මේකෙ- න් ඒ මිනිස්සුන්ගේ බඩට වදින ගමන් අපේ රටේ බඩටත් වදිනවා. මොකද අද ඒක තමයි අපේ ලෝක්කන් ගේ වගේම රටේම ප්‍රධාන ආදායම් මාර්ගය.

ඒ වගේම මෑතකදී ලෝකයෙ සිටි ගරිල්ලා නායකයො දෙන්නෙක් මැරුම් කෑවා. ඒ චෙච්නියාවේ එමිල් බස්සෙව් හා ඉරාක බිල්නා- ඩන් ගේ දෙවෙනියා. ඒ දෙන්නම මැරුම් කෑවෙ ලෝකෙ ලොකුම ලොක්කන් දෙන්නගෙන්. ඉරාක ගරිල්ලා නායකයා මියගිය සතුට බුෂ් මහත්තයා වින්දා වගේම රුසියාවෙ පුටින්, බසාසෙව්ව පරලෝ සැපත් කරලා බො- හෝ ඉහළින් ප්‍රීතිය භුක්ති වින්ද. ඒ වගේම බොහෝ දෙනෙක් බලාගෙන ඉන්නවා බින් ලාඩින්ටත්, ප්‍රභාකරන්ටත් මේ දේම වෙයි කියලා. කවුරුත් ත්‍රස්තවාදියට කැමැති නැහැ. ඒක ඇත්ත. මේ දෙන්නත් අත්වල අවි දරාගත්ත නායකයෝ. ඉන්නෙ හැංගිලා.

ඒ වගේම පුටින්, බුෂ් මහත්වරුන්ටත් ආයුධ තියනවා. හැබැයි අත්වල නැහැ. ඕන වුණාම තමන් පත්කර ගෙන ඉන්න පිරිසට දෙනව ගිහිල්ලා ගහපන් කියලා. ඉරාකෙ, ඇෆ්ගනිස්ථාන පැත්ත බැලුවම අපිට හොඳට ඒව පෙනෙනවා.

ඒ වගේම මේකට තව දෙයක් අපිට එකතු කරන්න වෙනවා. ඒ බින්ලාඩින්, බසයෙව්ල ඔක්කොම බිහිකලේ මේ මහත්තුරු තමයි. එදා පුටින්ට බින්ලාඩින් වහකදුරු වෙනකොට බුෂ්ට මී පැණි වුණා. ගජ මිතුරෝ විදියට හිටියෙ. ඒ නිසා බුද්ධ ධර්මයේ කියන අවි ගත්තන් අවියෙන් නැසෙති කියන කියමනට අවි දෙන්- න් යහතින් ජීවත් වෙති නැත්නම් හැංගි හෝ පණ බේරා ගනිති. කියලා අළුතින් එකතු කරන්න වෙනවා.

මට මේ ළඟදි මුණ ගැහුනා ඕමාර් කියල ඇෆ්ගන් ජාතිකයෙක්. ඔහු යුද්ධය නිසා සරණාගතයෙක් විදියට මෙහෙ ඇවිල්ලා තියෙන්නෙ. ඔහු කිව්වේ ඇමරිකාවට හෙට වුනත් බිල්ලාඩින් අල්ලල මරල දාන්න පුළුවන්. ඒත් ඔවුන් ඒක කරන්නේ නැහැ කියලා. තවමත් ඔවුන් මිතුරෝ කියලා බුෂ්ලගෙ පැවැත්ම තියෙන්නේ බිල් ලාඩින් ඉන්නකන් විතරයි කියලා.

අද බුෂ්ලට ලෝකෙ ඕන අතකට කරකවල ඕනම රටකට හොට දාන්න මාර්ගය හදල තියෙන්නේ බිල් ලාඩින් වගේ අය කියලා. ඒ කතාවේ ඇත්ත නැත්ත කෙසේ වෙතත් සිද්ධවෙන දේ නම් ඒක තමයි. ඒ නිසා ඒ කථාව නිකම්ම බැහැර කරන්න අපිට බැහැ.

අපි ලෝකෙ ටිකක් පැත්තකට තියලා ලංකාව දිහා ටිකක් හැරිලා බැලුවොත් සිද්ධ වෙන්නෙත් ඒ දේමයි කියලා හිතෙනවා. මගේ මිතුරෙක් කිව්වෙ ප්‍රභාකරන්ව ඉන්දියාවට හරි, ලංකාව හමුදාවට හරි අල්ලගන්න පුළුවන්. නමුත් ඒක කරන්නේ නැහැ කියලා. ප්‍රභාකරන් අල්ල ගන්නත්, නාල්ලගන්නත් යුද්දේ පවතිවී. ඒත් මේ කතාවේ නායකයා ප්‍රභාකරන් ඔහු අල්ල ගත්තොත් අඩු තරමින් යම්කිසි වෙනසක් හෝ සිදුවේවි කියලා මිනිස්සු හිතනවා.



හැබැයි බින් ලාඩින් වගේම ප්‍රභාකරන් බිහිකලෙත් අපිටමයි. ඊට පස්සේ ඉන්දියාව මෑන්ට ලොකු තල්ලුවක් දුන්නා. ලෝකෙ බිහිවෙච්ච දක්‍ෂතම ගරිල්ලා නායකයෙක් ප්‍රභාකරන්. ඔහු අවි ගත්තට තවමත් අවියෙන් නම් නැසුනෙ නැහැ. සමහරු හිතුව ලුණු වතුරෙන් නැසුනා කියලා. නැහැ ඒකත් බොරු.

ඔහු අවි අරන් තමන්ට අවි දිපූ අය නැසුවා. ඔහුට අවි දීපූ රජිව් ගාන්ධි, ප්‍රේමදාස පරලොව ඇරියා. මම මීට කලින් පුවත්පතකට ලිව්වා ප්‍රභාකරන්, වීරප්පන් චරිතය ටිකක් සමාන බවත්, ඔවුන් බිහිකලේ පලිගැනීමට බවත්. අද ඒක ඇත්තක් වෙලා තියෙනවා. මෑතකදී වීරප්පන්ගේ බිරිඳ පුවත්පත් සාකච්ඡාවකට සහභාගි වෙලා හුඟක් රහස් හෙළිකරලා තිබුණා. ඔහු සමඟ එකතු වෙලා හිටපු ඉන්දියාවේ දේශපාලනඥයො ගැන. ගස් කපල, ඇත්දල විකුණල හම්බකරපු දේශපාලනඥයෝ ගැන. ඒ විතරක් නෙවෙයි. ඔහුටත්, ඇයටත්, දරු- වන්ටත් ලංකාවේ රහසිගතව ජීවත්වීමට ප්‍රභාකරන් ආරාධනා කර, කටයුතු සලස්වා ඇති බවත් ඈ ප්‍රකාශ කළා. නමුත් හොර හෙළිවෙනකොට දේශපාලඥයෝ ඔහු මරා දැම්මා කියල ඈ අඬා වැළපෙමින් ප්‍රකාශ කළා.

ඉතින් මේ විදියට බලපුවම ලෝකෙ දේශපාලන නායකයෝ ගරිල්ලා නායකයෝ බොහෝ දුරට මිතුරෝ. මිතුරු වෙමින් සතුරු වෙමින් ලෝකෙ අහිංසක ජනයා එහාට මෙහාට පද්දනවා. වෙනසකට තියෙන්නේ කොටසක් ආයුධ බදාගෙන කැලේට වෙලා ඉන්නවා. අනෙක් අය ටයිකෝට් දාගෙන මන්දිරවලට වෙලා ඉන්නවා. මේ ඊයේ පෙරේදා මහින්ද මහත්තය, එල්.ටී.ටී.ඊ. එකේ දයා මාස්ටර් මහත්තයව කොළඹ ගෙන්නගත්ත හදවත් සැත්කමකට. නිකන් නොවෙයි. ඔහුටත් වඩා විශාල ආරක්‍ෂාවක් දීලා. මිනිසකුගේ රෝගී හදවත වෙනුවෙන් තව මිනිසෙකුගේ හදවත උණුවීම උත්තම ගතියක් ඒකෙ ඇති වරදක් නැහැ. හැබැයි මේ යුද්දෙ නිසා හදවත් නරක්වෙච්ච ලක්‍ෂගානක මිනිස- "සුන්ගේ හදවත් ගැන මේගොල්ලෝ හිතන්නැති එක තමයි ලොකුව වැරැද්ද. ඒ වගේම අනිවාර්යයෙන්ම දයා මාස්ටර් කොළඹින් හදවතක් දාගෙන ගිහිල්ලා පස්සෙ කරන්නෙ මහින්ද මහත්තයාගෙ හදවත නරක් කරන එක. ඊට පස්සේ කරන්නෙ හදවතට ප්‍රතිකාර ගන්න ඉස්සෙල්ලා 'බ්ලාස්ට්' කරල දාන එක.

*ඉතින් මේ විදියට බලපුවම ලෝකෙ දේශපාලන නායකයෝ ගරිල්ලා නායකයෝ බොහෝ දුරට මිතුරෝ. මිතුරු වෙමින් සතුරු වෙමින් ලෝකෙ අහිංසක ජනයා එහාට මෙහාට පද්දනවා. වෙනසකට තියෙන්නේ කොටසක් ආයුධ බදාගෙන කැලේට වෙලා ඉන්නවා. අනෙක් අය ටයිකෝට් දාගෙන මන්දිරවලට වෙලා ඉන්නවා.*

අපි හැමදාම රැවටිච්ච ජාතියක්. ජාතිය පටන් ගත්තෙත් රැවටිලා. විජය මාරු වුණොත් කුවේනි රවටලා. දැන් අපේ රටේ දෙමළ- සිංහල එකම ජාතියක් කියල හිතුවත් දෙගොල්ලන්ම එකාට එකා රවට්ටා ගන්නවා. අන්තිමට දෙගොල්ලන්ම ලෝකෙට රැවටෙනවා. අපි දෙගොල්ලන්ටම හොඳ අනුශාසනාවක් පන්සිය පනස් ජාතකයෙන් ගන්න පුළුවන්. ඒ රුක් ධර්ම

## යුරෝක් දහම් නිකේතනය.
## තෙසැත්තෑ ශ්‍රද්ධා පූජාවක්

දිනය: 2006.09.03
වේලාව: සවස 4.00

දහම් නිකේතනයේ අධිපති ත්‍රිපිටකවේදී ගරු කෝට්ටේ සන්තින්ද්‍රිය ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි ත්‍රිපිටකවේදී ශාස්ත්‍රපති ගරු දඹගස්ආරේ චන්ද්‍රසිරි ස්වාමීන් වහන්සේ මතුරට ගරු සංඝරක්ඛිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ කම්මට්ඨානාචාර්ය, ශාස්ත්‍රවේදී ගරු ගෝනවල අස්සජී ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සහභාගිත්වයෙන් සහ විහාරස්ථ දායක මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයෙන් මෙම මාහැඟි පින්කම ස්ද්‍ර කරනු ලැබේ ( ඔබ වෙනුවෙන් හෝ ඔබ දෙමව්පියන් වෙනුවෙන් භාර ගන්නා ත්‍රිපිටක ග්‍රන්ථ වල නම ලිපිනය සඳහන් කොට තැන්පත් කරන බවද කරුණාවෙන් සලකන්න)

වැඩි විස්තර සඳහා විමසන්න
විහාරස්ථානය ලේකම්




තුසිත් රවීන්ද්‍ර
අබේනායක

## කරගැට

සීතල රැයක තනියම
අත ගා බැලිම් අත්තල
ගොරෝසුව ගණ වුණ
කර ගැට ගෙනෙන සොම්නස

ගොර බිරම් යන්තර මැද
යකඩත් කැපී යන සඳ
සුසුමක් උනා පපුවට
යළි පොර වැදෙන දිවි මඟ

අත්වල නැගෙන කරගැට
පිට දිග ගලන දහඩිය
මා පුත් සිනා අබියස
සිහිනය ලෙසින් බොඳ වන

දූ දරු සිනා මුවගේ
රෑ බත ඉදෙන සුවඳේ
කම්කරු වෙහෙස දවසේ
නොදැනිම නිවෙන පුදුමේ

මස්පිඩු රිදෙන රෑ තල
උණුසුම සොයා ගුලි වන
ලේ හුරු සුවඳ දරු සැප
සරතැස නිවන අරුමය

**SCATS සංවිධානයේ අනුග්‍රහයෙන්**

මෙල්බන් නුවර ප්‍රවීණ ගායක
ගයිකාවන් සමඟ
ගී ගයන්නට
ඔබටත් අවස්ථාවක්

සැප්තැම්බර් 20 වන දිනට පෙර
පහත සඳහන් අංක වලට
අමතන්න
Monoranjan - 0403 580 927
Nelum - 0414 286 013
Prasad - 0431 360 123

**U.D. Electricals**
ඔබේ සියළුම ගෘහ විදුලි අවශ්‍යතා සඳහා
**බලයලත් විදුලි ශිල්පී**
Registered Electrical Contractors and Licenced Electrician (Rec 17240)
Down lights, Power points,
Sensor lights, Exhaust fans,
Heter lights, Safty switches,
Upgradig fuse boards
All Electrical Work
Call **Upali** 0422 052 425/ 03 97056697
Narre Warren
**Reasonabe Rates + All Work Gurenteed**